## 14. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

### 14.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | දිනැති 19 දෙසැම්බර් 1978 දරන භාණ්ඩාගාර 842 අංක ලේඛයවක්‍ර | වර්ෂයට පෙර 2006 අත්පත් කරගත් වත්කම් ස්ථාවර වත්කම් ඇතුළත් කර ලේඛනයට .නොතිබුණි |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 28 නොවැම්බර් 2002 දිනැති අංක 2002/02/අයිඒඅයිදරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි (1)891 | පවත්වා නොතිබුණි. |

### 14.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.325,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබු අතර වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 58 ත් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 14.3 අග්‍රිම ගිණුම

කොමිෂන් සභාවේ රැස්වීම් හා වැඩමුළු ආදිය සඳහා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 31 කදී රු.1,103,615 ක් වූ අත්තිකාරම් නිකුත් කර තිබුණු අතර ඉන් රු.582,467 ක් හෙවත් සියයට 52 ක් වැය නොකර නැවත මුදලින් පියවා තිබුණි. එසේම කළ යුතු නිශ්චිත වියදම හඳුනානොගෙන වැඩසටහන් වියදම් පියවා ගැනීම පිණිස නිලධාරීන් 06 දෙනෙකු වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.75,000 බැගින් එකතුව රු.450,000 ක අත්තිකාරම් නිකුත් කර තිබුණි.

### 14.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

#### 14.4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය , කාර්ය මණ්ඩල විස්තර සහ අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඇතුළත් කර නොතිබු අතර 2014 ඔක්තෝබර් 30 දින සංශෝධනය කරන ලද එම සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබුණි.

**14.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර එම සැලැස්මේ ඇතුළත් නොවූ රු.302,600 ක් වටිනා කාර්යාල යන්ත්‍ර උපකරණ ඒකක 05 ක් මිලදී ගෙන තිබුණි.

**14.4.3 අභ්‍යන්තර විගණනය**

ආරම්භයේ සිට 2015 ජුනි 25 දින වන විටත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**14.5 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි (2)262 | 768,709 | ගෙවීම් වවුචර් ක උපයෝගී 28 ලියවිලිවල"ගෙවන ලදි " මුද්‍රාව තබා නොතිබුණිමේ නිසා වරක් ගෙවීම් කළ . ලියවිලි නැවත ගෙවීමේ අවධානමක් .පවතින බව නිරීක්ෂණය විය |
| (ii ) | මුදල් රෙගුලාසි (1)261 | 296,205 | අවස්ථා මික කදී මුදල් පොතේ අනුක්‍ර 11 අංක පිළිවෙලට වවුචර් අංක සටහන් මික අංක අනුක්‍ර කර නොතිබූ අතර පිළිවෙලට ඇති අවස්ථාවල චෙක්පත් අංක අනුපිළිවෙළට නොමැති අවස්ථා .නිරීක්ෂණය විය |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි රාජ්‍ය ආයතන විසින් ගෙවනු ලබන රු.25,000 ඉක්මවන එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපතිට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා යැවිය යුතු වුවත්, කොමිෂන් සභාවේ රු.5,140,800 ක් වූ ගොඩනැඟිලි බදු කුළී සඳහා ගෙවූ රු.550,800 ක් වූ එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තා යවා නොතිබුණි.

**14.6 කාර්යසාධනය**

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්**
**-----------------------------------------------**

කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන මුද්‍රණය කිරීම.
(ආ) තුන්වන වර්ගයේ පාසැල් සඳහා දත්ත පාදයක් සකස් කිරීම යටතේ පළාත්වලින් රැස්කර ගන්නා දත්ත ආශ්‍රයෙන් නිර්ණායක සකස් කිරීම.
(ඇ) අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කිරීම.
(ඈ) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ වලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ එහිදී සළකා බැලෙන නිර්ණායක පිළිබඳ දත්ත රැස්කර , විශ්ලේෂණය කර වාර්තාව සකස් කිරීම.
(ඉ) සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය යටතේ කෙටුම්පත් වාර්තාව සංස්කරණය කර අවසන් වාර්තාව සකස් කිරීම.
(ඊ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම යටතේ ක්ෂේත්‍ර සමාලෝචනයන් ආශ්‍රයෙන් තොරතුරු රැස් කර දත්ත විශ්ලේෂණය කර වාර්තාව සකස් කිරීම.
(උ) කාර්ය මණ්ඩල පුද්ගලික දත්ත එකතු කර කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.

**14.7 අවිධිමත් ගනුදෙනු**
**-----------------------**

වායුසමන යන්ත්‍ර 03 ක් එකක් රු.95,200 බැගින් රු.285,600 කට මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශයෙන් බැහැරව තාක්ෂණික දැණුම ඇති නිලධාරියෙකු සහිත තාක්ෂණික අගැයීම් කමිටුවේ නිර්දේශයකින් තොරව හා අවම ලංසුකරුගේ මිල වූ රු.70,784 ක ලංසුව හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර අටවන මිල ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදී ගෙන තිබුණි. මේ නිසා යන්ත්‍ර 03 ක් වෙනුවෙන් රු.73,248 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**14.8 අනාර්ථික ගනුදෙනු**
**----------------------**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ ආකාරයට ආයතනයේ මධ්‍යකාලීන සැලැසුම සකස් කිරීම සඳහා රු.320,650 ක වියදමකින් වැඩමුළු දෙකක් පවත්වා තිබුණද මධ්‍යකාලීන සැලැසුම සකස් කිරීමට නොහැකි වී තිබූ අතර "ආයතනය තුළින් සපයාගත නොහැකි කෙටිකාලීන හදිසි සේවාවන් සපයා ගැනීම" සඳහා වන 2014 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුචිත ආකාරයට යොදා ගනිමින් එහි එක්දින වැඩමුළුවක සම්පත් දායක දීමනා ලෙස එක් පුද්ගලයෙකුට රු.30,000 ක් ගෙවා තිබුණි.

**14.9 කළමනාකරණ දූර්වලතා**
**--------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) පුස්තකාලයේ කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරියෙකු ස්ථිර ලෙස පත් නොකිරීම, පුස්තකාල පොත් සම්බන්ධයෙන් භෞතික තොග සමීක්ෂණයක් ආරම්භයේ සිටම සිදුකර නොතිබීම, පුස්තකාලයෙන් බැහැර ගෙනයන පොත් ආපසු භාර නොදීම හා භාරදීමට බොහෝ කල්ගතවීම සහ විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් දෙදෙනෙකු ඇතුළුව තුන්දෙනෙකු විසින් රැගෙන ගිය පුස්තකාල පොත් 04

ක්, මාස 10 සිට වසර 04 දක්වා පරාසයක් ගතවී තිබුණත්, එම පොත් 2015 ජුනි 25 දින වන විටත් ආපසු භාර දී නොතිබුණි.

(ආ) ''විවිධ මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු රැස්කොට එම තොරතුරු විධිමත් ලෙස විශ්ලේෂණය කිරීමෙන් තීරණ ගැනීමේ පදනමක් ලෙස යොදා ගැනීම'' අරමුණු කරගෙන අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතියේ රු.938,600 ක මූල්‍යාධාර උපයෝගි කරගෙන 2010 වර්ෂයේ පිහිටුවන ලද දත්ත බැංකුවේ කාර්යයන් ඉටුකිරීමට අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් වැඩසටහන් නිලධාරි (තොරතුරු) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකර කෙටිකාලීන පුහුණුවන්නන්ගේ සේවය යොදා ගෙන තිබුණි.

## 14.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ii) | තෘතීයික මට්ටම | 06 | 06 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 16 | 12 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | | 36 | 32 | 04 |